# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය**

## ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණකාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2024 වර්ෂය

**2024 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.**

1. (අ) වයස : 2024.08.04 වැනි දිනට අවුරුදු 16ත් 22ත් අතර විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස.(සා/පෙළ) විභාගයේදී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත් වීම

හෝ

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත් වීම

**විශේෂ කුසලතා :**

විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරඟ වලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත ක්ෂේත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ තරඟ වලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහළ ජයග්‍රහණයක් ලබා ඇති අයදුම්කරුවන් ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය.

(ඇ) සැ.යු. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ වසර 03ක් හෝ වැඩි කාලයකට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකළ යුතුය.

2. **පාඨමාලා මාධ්‍යය**

මෙහි දැක්වෙන සියළුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර, මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ.

සෛද්ධාන්තික දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන්ද පැවැත්වේ.

3. **ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණය**

අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

(අ) විභාගය පවත්වන මාධ්‍යය : සිංහල / දෙමළ

(ආ) **විභාග මධ්‍යස්ථාන :** කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය සහ කිලිනොච්චිය (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථාන වලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් වෙනත් මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත)

**විභාගයට අදාළ විෂයයන්**

ඇතුලත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, කාර්මික දැනුම, කාර්මික ඇඳීම සහ ඉංග්‍රීසි භාෂා දැනුම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. **විභාග ගාස්තු**

අයදුම්පතෙහි සඳහන් ක්‍රමවේදයට අනුව විභාග ගාස්තු වශයෙන් රු.1000/- ක මුදලක් ගෙවිය යුතුය. මෙම ක්‍රමවේදය හරහා හැර වෙනත් කිසිදු ක්‍රමයකට ගෙවන ලද විභාග ගාස්තු පිළිගනු නොලැබේ. ඇතුලත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. **මූලික තෝරාගැනීම**

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතා පදනම මත යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේදී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත.(අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ)

6. **අවසන් තෝරා ගැනීම**

යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත. ලකුණු ලබා දෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40% ක් ද සම්මුඛ පරීක්ෂණය සඳහා 60% ක් ද වශයෙනි. විෂය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණු පාඨමාලා සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතුය.

7. **පුහුණු පාඨමාලා**

| අනු අංකය | පාඨමාලාව | කාලසීමාව (අවුරුදු) |
|---|---|---|
| 01 | මෝටර්රථ තාක්ෂණ ශිල්පී<br>Automobile Technician | 04 |
| 02 | මිල්රයිට් තාක්ෂණ ශිල්පී<br>Millwright Technician | 04 |
| 03 | වායු සමීකරණ සහ ශීතකරණ තාක්ෂණ ශිල්පී<br>Refrigeration & Air Conditioning Technician | 03 1/2 |
| 04 | බල විදුලි තාක්ෂණ ශිල්පී (කර්මාන්තගත)<br>Power Electrical Technician (Industrial) | 03 1/2 |
| 05 | යන්ත්‍රණ ශිල්පී<br>Machinist (General) | 03 1/2 |
| 06 | කර්මාන්තගත මෙකාට්‍රොනික් තාක්ෂණ ශිල්පී<br>Industrial Mechatronics Technician | 03 1/2 |
| 07 | ඩීසල් කාර්මික ශිල්පී<br>Diesel Mechanic | 03 |
| 08 | වාහන විදුලි ශිල්පී<br>Automobile Electrician | 03 |
| 09 | පෑස්සුම් ශිල්පී<br>Welder | 03 |
| 10 | මෝටර් වාහන බොඩි අළුත්වැඩියා හා පින්තාරු ශිල්පී<br>Motor Vehicle Body Repairer & Painter | 03 |

අයදුම්කරුගේ කැමැත්තේ අනුපිළිවෙල අනුව උක්ත පාඨමාලා සඳහා අයදුම් කළ යුතුය.

8. **ගිවිසුම් අත්සන් කිරීම**

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාළව අවු 03, 03 1/2, 04 ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

9. **අයදුම් කිරීම සඳහා උපදෙස්**

සියලුම අයදුම්කරුවන් අයදුම් කිරීම සිදු කළ යුත්තේ මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ පමණක් වේ.

මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සිදු කළ යුතු වන අතර අදාළ මාර්ගගත ක්‍රමය (Online System) සඳහා පිවිසීමට පහත සඳහන් සබැඳිය භාවිතා කළ යුතු වේ.

https://germantec.lk/index.php/register-now/

තාක්ෂණික විමසීම් - 0701 640 650 - රුචිර රණසිංහ මහතා

මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම්කිරීමට පෙර අදාළ සබැඳියෙහි දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් අයදුම් කිරීම සිදු කළ යුතුය.

ඉහත ලබා දී ඇති උපදෙස් පිලිබඳව අවධානයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් අයදුම්කරු පත්වන අපහසුතාවය පිලිබඳ ආයතනය කිසිදු වගකීමක් දරනු නොලබන අතර අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු කූට හෝ වංචනික බවට හෙළි වුවහොත් අයදුම්කරු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන අතර මින් ඉදිරියට ආයතනයේ විභාග සඳහාද නුසුදුස්සෙකු වනු ඇත.

2024.07.12 දිනැති ගැසට් පත්‍රයේද පල කර ඇත.

වැඩිදුර විස්තර සඳහා www.germantec.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

10. **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය**

**අංක 9හි ඇති සබැඳියෙහි (link) දක්වා ඇති උපදෙස් පත්‍රිකාව අනුගමනය කරමින් 2024.08.04 දින හෝ එදිනට පෙර මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් කිරීම සම්පූර්ණ කල යුතුය.**

11. **විභාග ප්‍රවේශපත්‍ර**

සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාල විභාග ප්‍රවේශපත්‍ර 2024.08.26 දින වන විට ලැබීමට සලස්වන අතර ඒ වන විටත් ප්‍රවේශපත්‍රය නොලැබුණු අයදුම්කරුවන් වේ නම් එදින සිට දින 03ක් ඇතුලත පහත දුරකථන අංකයෙන් විමසිය යුතුය.

**කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්**
**ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය**
**නො 582, ගාලු පාර, ගල්කිස්ස.**
**(අගුලාන හංදිය අසල)**
**දුරකථන අංක - 0112605625 / 0112605535**